රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳව මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2022 මුදල් වර්ෂය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
(බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය)

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
1	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
2	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
3	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	බුද්ධශාසන අංශය වෙත යොමු වූ විගණන විමසුම් සියල්ලටම මසක්තුල පිළිතුරු සපයා ඇත. පිලිතුරු යැවීමට කාලය අවශ්‍ය විට අතුරු පිළිතුරක් යොමු කිරීමට පියවර ගනු ලැබේ.
4	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	බුද්ධශාසන අංශය වෙත යොමු වූ අභ්‍යන්තර විගණන විමසුම් සියල්ලටම මසක්තුල පිළිතුරු සපයා ඇත. පිලිතුරු යැවීමට කාලය අවශ්‍ය විට අතුරු පිළිතුරක් යොමු කිරීමට පියවර ගනු ලැබේ.
5	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	2022 වසරේ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි විධිමත් අවදානම් පාදක විගණන සැලැස්මක් සකස් කර ඇති බවත්, එහි පිටපත් ලේකම්තුමාගේ අනුමැතියෙන් විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපති වෙත නියමිත දින වලදී යොමු කර ඇත.
6	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු 04ක් පැවැත් වූ බවත් එහි සියලු තොරතුරු අප අංශය සතුව ඇති බවත්, ඒ සඳහා සාමාජිකයන් සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරී ද පැමිණි බවත් සහතික කරමි.

		2022 වර්ෂයේ මුල් කාර්තුවෙන් පසුව ජාතික උරුම අංශය මෙම අමාත්‍යාංශය යටතට පැවරුන අතර 2022 වර්ෂයේ මුල් කාර්තු දෙකෙහි විගණන හා කළමනාකරණ කමිටු රාජ්‍ය අමාත්‍යාංශය ලෙසත්, අවසන් විගණන හා කළමනාකරණ කමිටු මෙම අමාත්‍යාංශය යටතේද වශයෙන් එම අංශයේ සියලුම විගණන හා කළමනාකරණ කමිටු පැවැත් වූ බව සඳහන් කරමි.
7	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේදී සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
8	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
9	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	එක් වාහනයක හැර අනෙක් සියළු වාහන වල අයිතිය තහවුරු කරන ලියවිලි ඇත. ලියවිලි නොමැති වාහනයේ ලියවිලි ලබාගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.
10	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	1985.05.10 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 289 ප්‍රකාරව රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීම සිදුකර ඇත.
11	වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	එක් වාහනයක් පමණක් ඇත. එම වාහනය අපහරණ ක්‍රමවේදයට අනුව සියළු කටයුතු අවසන් කලද තක්සේරු මුදලට වඩා අඩු මිල ගණන් ඉදිරිපත් වී තිබුණ බැවින් නැවත අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

12	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	2022 වර්ෂය තුල පැවති ආර්ථික අර්බුධකාරී තත්වය හේතුවෙන් අයවැය මඟින් ප්‍රතිපාදන කාර්තු වශයෙන් වෙන් කර තිබුණි. ඒ අනුව ඌන සංවර්ධිත විහාරස්ථාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන (වැය ශීර්ෂය 101-26-6-8-2205) යටතේ තුන් වන කාර්තුව සඳහා ලද ප්‍රතිපාදන ප්‍රමාණය සම්පූර්ණයෙන්ම එම කාර්තුව තුල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත. හතරවන කාර්තුවට අදාලව උක්ත වැය ශීර්ෂය යටතේ ලද ප්‍රතිපාදන එම කාර්තුව තුල ආයතන වෙත නිදහස් කර ඇත. ඒ අනුව මෙය සාමාන්‍ය පරිපාලන දෝෂයක් නොව එම අවස්ථාවේ තිබූ මූල්‍යමය ප්‍රතිපත්තිමය ක්‍රමවේදයකි. මෙම වැඩසටහන යටතේ වාර්ෂිකව වෙන් වන මූල්‍ය ප්‍රතිපාදන වලින් හදිසි හා විශේෂ ආපදා තත්ත්වයකදී භාවිතා කිරීමට සෑම වර්ෂයකදීම යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් (5%) වෙන්කර රඳවා ගන්නා ලදී. ඉතිරි සියළුම ප්‍රතිපාදන (95%) තුන්වන කාර්තුව අවසන් වීමට ප්‍රථම අදාල ආයතන වෙත නිදහස් කරනු ලැබේ. එසේම හදිසි අවස්ථාවයක් සඳහා රඳවාගත් ප්‍රතිපාදන (5%) ප්‍රමාණය අවසන් කාර්තුව තුල නිදහස් කරනු ලැබේ.
13	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	1. කාර්යාල සේවක සේවයේ ජී.එස්.එම්. කරුණාරත්න මහතා වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීමට කටයුතු සිදු කර ඇති අතර, නැවත සේවය නිර්දේශ වී ඇත. එබැවින් සේවයට වාර්තා කිරීම අනුව ණය මුදල අයකරගත හැකිය. 2. වැඩ තහනම් කරන ලද කාර්යාල සේවක සේවයේ එම්.එච් සුනිත් මහතාගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු. 18,155ක මුදල ගෙවා අවසන් කරන ලෙස නැවත 2024.01.29

		දිනැතිව දන්වා යවා ඇත. මේ වන තෙක් ගෙවීම් කටයුතු සිදුකර නොමැති බැවින් නීතිමය කටයුතු සිදුකර ණය ශේෂ අයකර ගන්නා ලෙස දන්වා නීති නිලධාරී වෙත 2024.07.23 දිනැතිව ලිපියක් යොමුකර ඇත. (2024.07.23 දින රු.2000/- තැන්පත් කර ඇත)
14	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	විද්‍යාලංකාර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමට අදාළව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ගෙවීමට ඇති තැන්පත් වන අතර ඉදිකිරීම් වලට අදාළව පවතින අඩුපාඩු සම්පූර්ණ කරන තෙක් රඳවා ගෙන ඇත.
15	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාරය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර ගැනීමට පියවර ගනු ලැබේ.
16	වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2022 වර්ෂය සඳහා 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත එනම් 5.31 දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අනුව හැකි උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව කාර්යය සාධන වාර්තාව සකස් කර විගණකාධිපති නිරීක්ෂණ ලබාගැනීම සඳහා 2023.02.28 දිනැති ලිපිය මගින් 2023.03.02 දින රජයේ විගණන අංශය වෙත භාරදී දී ඇති අතර විගණකාධිපති නිරීක්ෂණ 2023.06.09 දිනැති ලිපිය මගින් 2023.06.12 වන දින සංවර්ධන අංශය වෙත ලැබීමෙන් අනතුරුව එම වාර්තාව ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර 2023.07.11 දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතින් මුද්‍රණය කරවා 2023.07.25 දිනැති ලිපිය මගින් 2023.07.26 දින පාර්ලිමේන්තුව වෙත භාරදී ඇත.

		තවද 2023 මූල්‍ය වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව කෙටුම්පත් කර විගණකාධිපති නිරීක්ෂණ ලබා ගැනීම සඳහා 2024.03.04 දින රජයේ විගණන අංශය වෙත භාරදී ඇති අතර, 2024.08.07 දිනැති විගණන වාර්තාව මේ වන විට පරිවර්තන කටයුතු සිදු කරමින් පවතී.
17	2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීම සිදුකර ඇත. ප්‍රමාදයක් වී නැත.
18	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	බුද්ධශාසන අංශයේ ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව පැමිණිලි ලැබී නැත.
19	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍ර ලේඛය ප්‍රකාරව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර ඇත.
20	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	එක් එක් අංශ වලට අදාළ කොටස් සම්බන්ධව එකී අංශ ප්‍රධානී විසින් අධීක්ෂණය කිරීම සිදුවේ.
21	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	බුද්ධශාසන අංශය මඟින් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් වෙනුවෙන් ලබාදී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 80% ඉක්මවා ඇත. රට තුළ පැවති කෝවිඩ් වසංගත තත්වය හා මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වූ චක්‍රලේඛය හේතුවෙන් පුහුණු අවස්ථා ප්‍රමාණය 100% මට්ටමට ළඟා වීමට නොහැකි වුවද, වර්තමානය

		වන විට පුහුණු අවස්ථා ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කර ඇත.
22	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අභිකර මට්ටමේ විය.	යටත් මට්ටමේ විගණන මතයකි. මෙම මතයට හේතු වූ පහත කරුණු නිවැරදි කර ඇත. 1.6.1 මූල්‍ය නොවන වත්කම් (අ) 1. PA-7082 හා 32-5816 වාහන නිත්‍යානුකූලව මහා භාරකාර දෙපාර්තමේන්තුවට හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට පවරා ඇත. 11. 18-4263 වාහනය තක්සේරු කර ඇති අතර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරමින් පවතී. 1.6.2 හානි පිළිබඳ ලේඛනය හා ඇප ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
23	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	එම වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩු බොහොමයක් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
24	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	වාර්ෂිකව ස්ථාන මාරු යටතේ වසර 5 කට වැඩි සේවා කාලයක් සේවය කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යවා ඇත. එමඟින් ලැබෙන ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු කිරීම සිදුකර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (සංස්කෘතික කටයුතු අංශය)

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	සම්පූර්ණයෙන් යාවත්කාලීන කර ඇත.

2	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අභ්‍යන්තර විගණනයට අදාළ වේ.
3	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2022 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් විගණන විමසුම් 16ක් ඉදිරිපත් කර ඇති අතර එයින් විගණන විමසුම් 12ක් සඳහා මසක් තුළ පිළිතුරු සපයා තිබුණි. ඉතිරි විගණන විමසුම් 04න් 02ක් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍රගත කර ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් වේ. එම විගණන විමසුම් සඳහා ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන හරහා අදාළ නිරීක්ෂණයන් ලබා ගෙන පිළිතුරු සකස් කළ යුතුව තිබූ හෙයින් ඒ සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත වී ඇත.
4	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	සංස්කෘතික අංශය සඳහා 2022 වර්ෂයට ලැබී ඇත්තේ එක් අභ්‍යන්තර විගණන විමසුමක් වන අතර ඒ සඳහා මසක් තුළ පිළිතුරු සපයා ඇත. 2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 04 ක් ලැබී ඇත. එයින් විගණන විමසුම් 03ක් සඳහා පිළිතුරු යොමු කර ඇති අතර ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍රගත කර ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන විමසුම් වේ. ඒ අනුව ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන හරහා අදාළ නිරීක්ෂණයන් ලබා ගෙන පිළිතුරු සකස් කළ යුතුව තිබූ හෙයින් ඒ සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී ලැබෙන අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අතර පිළිතුරු මසක් ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
5	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙළ කර ඇත්තේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින්ය. 2024 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන වැඩසටහන් මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා පිළියෙළ කිරීමට කටයුතු කර ඇත.

6	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ප්‍රධාන අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වනු ලැබේ.
7	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 ජූනි මස 15 දින මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කර වාර්තා විගණකාධිපති වෙත පිටපත් යොමු කර ඇත.
8	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	දිවයින පුරා විහිදී ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 195ක හා අමාත්‍යාංශ පරිශ්‍රයේ අංශ 40ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු කිරීමේ දී ඇති වන සංකීර්ණත්වය හේතුවෙන් අතිරික්ත, ඌනතා පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීමට අවශ්‍ය නිර්දේශ ලිපි මේ වන විට සම්පූර්ණයෙන් යවා අවසන් කර ඇත.
9	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අංක 03/2018 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කර මෙම වාහන කඩිනමින් මෙම අංශයට පවරා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.
10	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සංචිතයේ ධාවන තත්ත්වයේ ඇති සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
11	වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත තත්ත්වයේ ඇති වාහන වලින් YY-8971 අංක දරණ ත්‍රීරෝද රථය 2023.11.10 දින අපහරණ ය සිදු කර ඇත. එයට අමතරව තිබූ 301-4103 දරණ රථය වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරු මිලදී ගැනීම ප්‍රතික්ෂේප කළ බැවින් අපහරණය කිරීමට නොහැකි විය.18-7052 දරණ රථය රජයේ තක්සේරු මුදලට ලංසු ඉදිරිපත් වී නොතිබුණි. නැවතත් බුද්ධශාසන අංශය මගින් 2023.10.18 වන දින සිදු කරනු ලැබූ වාහන අපහරණය සඳහා අංක 301-4103 හා අංක 18-7052 දරණ

		රථයන් යොමු කරන ලද අතර එහිදී අංක 301-4103 දරණ රථය වැඩිම වටිනාකමට විකිණීම සිදු කර ඇත. නමුත් එහිදී ද 18-7052 දරණ රථය සඳහා රජයේ තක්සේරු මුදලට ලංසු ඉදිරිපත් වී නොතිබුණි. එබැවින් නැවතත් එම රථය සංශෝධිත තක්සේරුවක් කර අපහරණයට යොමු කිරීමට බලාපොරොත්තු වේ.
12	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	මෙම වසරේ ක්‍රියාකාරකම් සැලැස්මට අනුව වෙන් වූ ප්‍රතිපාදන අතුරින් මේ වන විට 78% ක පමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇති අතර ඉතිරි 22% ක ප්‍රතිපාදන නිදහස් කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.
13	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව **ඇමුණුම-01** මගින් පැහැදිලි කර ඇත. (මේ සමඟ අමුණා ඇත.)
14	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	6000-13-0-138 (තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු) පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත. 6000-16-0-73 (කොන්ත්‍රාත් සඳහා රැඳවුම් තැන්පතු) පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොමැත.මන්ද සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවසන් තීරණයක් මෙතෙක් අමාත්‍යාංශය ගෙන නොමැති බැවින් කල් ඉකුත් වූ නමුත් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාළ රැඳවුම් තැන්පතු පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇත.

15	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාරය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ.371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේ දී එම කාර්යය නිම වී නිරවුල් කිරීමට අදාළ පියවීම් කටයුතු අඩුපාඩු සහිතව ලැබීමෙන් අනතුරුව නැවත ඒවා සකස් කර ඉදිරිපත් කිරීමේ දී යම් ප්‍රමාදයක් සිදු වුණි. ඉදිරි කටයුතු වලදී තත්කාර්ය අතුරු අග්‍රිමයන් නිකුත් කර මාසයක් තුළ නිරවුල් කිරීමට දැනුවත් කර ඇති අතර එසේ නොවීමට කටයුතු කළ බව දන්වමි.
16	වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සැකසීමේ කාර්යයයේ දී බුද්ධශාසන අංශය හා සංස්කෘතික කටයුතු අංශය ඒකාබද්ධව සිදු කරනු ලබයි. එබැවින් සංස්කෘතික කටයුතු අංශයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීමෙන් අනතුරුව බුද්ධශාසන අංශය වෙත යොමු කරනු ලබන අතර බුද්ධශාසන අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා එක් කොට එක් වාර්තාවක් වශයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. එහිදී සංස්කෘතික කටයුතු අංශයට අදාළ 2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව බුද්ධශාසන අංශය වෙත යොමු කිරීම ප්‍රමාදයකින් තොරව ඉටු කර ඇති බව කාරුණිකව දන්වමි.
17	2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	2024 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවලට අදාළව කාර්ය මණ්ඩල තොරතුරු යැවීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී නොකඩවා එම තොරතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
18	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	2023 මාර්තු මාසයේ සිට තොරතුරු ලියාපදිංචි කිරීමේ ලේඛනයක් පවත්වාගෙන යන අතර පැමිණිලි ලේඛනගත කිරීම හා ගනු ලැබූ ක්‍රියාමාර්ග එහි සඳහන් කරනු ලබයි.

19	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍ර ලේඛය ප්‍රකාරව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	අමාත්‍යාංශයේ නාමය හා යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් සිදු ව ඇති වෙනස්කම් ඇතුළත් කරමින් පවතින ප්‍රඥාප්තිය ඒ අනුව සංශෝධනය කිරීමට ද, ඒ අනුව අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට ද කටයුතු කරගෙන යනු ලැබේ.
20	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
21	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂයට අනුව කොරෝනා වසංගතය හා ඉන්ධන අර්බුදය අනුව නිලධාරීන් කඩින් කඩ සේවයට වාර්තා කිරීම නිසා නිසි ලෙස පුහුණු අවස්ථා කිරීමට නොහැකි විය. නමුත් මේ වන විට පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරගෙන යනු ලැබේ.
22	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අභිකර මට්ටමේ විය.	අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය සඳහා 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ඉදිරිපත් කර ඇත.
23	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
24	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	<u>කාර්යාල සේවක සේවය හා ඒකාබද්ධ රියදුරු සේවය</u> මෙම අමාත්‍යාංශයේ වසර 5 සම්පූර්ණ කා.කා.සේ. නිලධාරීන් හා ඒකාබද්ධ සේවයේ රියදුරන් ස්ථාන මාරු කර යවා ඇත. **වර්තමාන තත්ත්වය** මෙම වසරේ සිට (2024) සංස්කෘතික අංශයේ වසර 05 සම්පූර්ණ කරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන් හා ඒකාබද්ධ සේවයේ රියදුරන්ගේ වාර්තාව වාර්ෂික ස්ථාන මාරු වීම්

		වලට අදාළ ව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. <u>කළමනාකරණ සේවා නිලධාරී සේවය</u> අනුප්‍රාප්තිකයින් රහිතව කළමනාකරණ සේවා නිලධාරීන් කිහිප දෙනෙකු ස්ථාන මාරු ලබා ඇත. සංස්කෘතික කටයුතු අංශයේ කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු 16ක් පමණ තිබෙන බැවින් වාර්ෂික ස්ථානමාරු ලද නිලධාරීන් පවා සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කර නොතිබුණි. වසර 05ට වැඩි කළමනාකරණ සේවා නිලධාරීන් කිහිප දෙනෙකු වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර නොතිබුණි. **වර්තමාන තත්ත්වය** මෙම වසරේ සිට (2024) සංස්කෘතික අංශයේ වසර 05 සම්පූර්ණ කරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන්ගේ වාර්තාව වාර්ෂික ස්ථාන මාරු වලට අදාළව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. එහි උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ , මේ වන විට වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් සිදු කර ඇත. ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික ස්ථානමාරු නියෝගයන්ට අනුකූලව ක්‍රියාත්මක කර ඇති වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (ජාතික උරුම අංශය)

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
1	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2024 වර්ෂයේ සිට නිසි පරිදි ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
2	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	
3	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2022 වර්ෂය තුළ ලැබුණු බොහොමයක් විගණන විමසුම් සඳහා මාසයක කාලයක් තුළ පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඇතැම් විගණන විමසුම් ජාතික උරුම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වන ආයතනයන්ට අදාළ වූ බැවින් එම ආයතන ප්‍රධානීන් මඟින් පිළිතුරු කැඳවා ඒ අනුව ජාතික උරුම අංශය විසින් පිළිතුරු ලබාදීමේ දී මාසයක් ඉක්ම වූ අවස්ථා ඇත. මේ වන විට ලැබෙන විගණන විමසුම් සඳහා නියමිත දිනට පෙර පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
4	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2022 වර්ෂයේ නෙළුම් පොකුණ රඟහලට අදාළව පමණක් ජාතික උරුම අංශය වෙත ඉදිරිපත් වූ අභ්‍යන්තර විගණන විමසුම සඳහා මාසයක කාලයක් තුළ පිළිතුරු ඉදිරිපත් කර ඇත.
5	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ 2022 අභ්‍යන්තර විගණන සැලැස්ම සකසා ඉදිරිපත් කරන ලදී.
6	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණක වරයකු නොසිටි

		අතර, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ වැඩ බැලීම අනුව කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.
7	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය නිසි පරිදි සිදුකර ඇත. එම වාර්තා අතපසුවීමකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත. 2023.08.16 දින එම වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු සිදුකර ඇත.
8	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයට අනුව අතිරික්ත හා ඌනතා හඳුනාගෙන ඇති අතර, ඇතැම් ආයතනයන්හි භාණ්ඩ වෙන්දේසි කටයුතු ද සිදුකර ඇත. එක් එක් ආයතනයන්හි භාණ්ඩ අපහරණය කිරීමේ කටයුතු සඳහා පත්කල කමිටුව විසින් වාර්තාවද ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්ටද අවධානය යොමු කරමින් අතිරික්ත හා ඌනතා සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ අපහරණ කටයුතු සිදුකිරීමට කටයුතු සිදුකරනු ලැබේ.
9	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	2020 අගෝස්තු මස අභිනවයෙන් ස්ථාපනය කරන ලද ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙනත් ආයතන වලින් ලබාදුන් සියලු වාහන වල අයිතිය පවරා ගැනීමේ කටයුතු 2022 වර්ෂය තුලදී ආරම්භ කරන ලදී. මේ වන විට සියලු වාහන වල අයිතිය විධිමත්ව පවරාගෙන අදාළ ලිපි ලේඛන විධිමත්ව පවත්වාගෙන යනු ලැබේ.

10	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය අලවා ඇත.
11	වාහනයක් ගර්හිත වී මාස 8ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2022 ගිණුම් වර්ෂය තුළ ජාතික උරුම රාජ්‍ය අමාත්‍යාංශය සතුව එවන් වාහන නොතිබිණි.
12	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	ජාතික උරුම අංශය යටතේ එලෙස ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන්කිරීමක් 2022 වර්ෂයේ සිදු නොවුණි.
13	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක හිඟ ණය ශේෂ නොතිබිණි. 2022 මුදල් වර්ෂයේ දී මාස 03 – 12 අතර කාලසීමාවට අදාළව හිඟ ණය ශේෂයක් පැවති අතර, මේ වන විට එම ණය ශේෂය නිරවුල් වී ඇත.
14	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මස අභිනවයෙන් ස්ථාපනය කරන ලද බැවින්, පොදු තැන්පතු ගිණුම ඒ අනුව ආරම්භ වූවකි. එබැවින්, 2022 මුදල් වර්ෂය අවසන් වන විටත් කල් ඉකුත් වූ තැන්පතු නොතිබිණි.
15	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාරය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	2022 මුදල් වර්ෂය තුළ නිකුත් කල තත්ත්කාර්යය අතුරු අග්‍රිම සියල්ල අදාළ කාර්යය නිම වී මසක් ගතවීමට ප්‍රථම නිරවුල් කර ඇත.
16	වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාව ලද පසු වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරන ලදී.
17	2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	වර්තමානයේ සෑම කාර්තුවක් අවසානයේම කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

18	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	මහජනයා විසින් ඉල්ලා සිටින තොරතුරු සම්බන්ධ ලේඛනයක් 2023 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලබන අතර, එම තොරතුරු ලේඛනයෙහිම තොරතුරු ලබා නොදීම සම්බන්ධ පැමිණිලි පිළිබඳ තොරතුරු හා ගනු ලබන ක්‍රියාමාර්ගයන්ද ඇතුළත් කරමින් අදාළ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
19	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍ර ලේඛය ප්‍රකාරව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
20	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට ඒ සඳහා වන ක්‍රමවේදයක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමුකර ඇත.
21	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පැවති මූල්‍ය ප්‍රවාහ තත්ත්වයන් එලෙස පුහුණු අවස්ථා සීමා කිරීමට හේතු වී ඇත.
22	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අභිකර මට්ටමේ විය.	විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කරමින් අවශ්‍ය පසුවිපරම් හා අධීක්ෂණ ක්‍රියාවලීන් සිදුකර ඇත.
23	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකර ඇති අතර, අවශ්‍ය පසුවිපරම් හා අධීක්ෂණ ක්‍රියාවලීන් සිදුකරනු ලැබේ.
24	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	2020 අගෝස්තු මස 09 දින අභිනවයෙන් ස්ථාපිත වූ ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අනුයුක්ත නිලධාරීන්ගෙන් බහුතරයක් එම අවස්ථාවේ නවක උපාධිධාරී අභ්‍යාසලාභීන් වූ

		අතර, අනුයුක්ත අනෙක් සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් කිහිපදෙනා ද 2022 ගිණුම් වර්ෂයේ දී මෙම අමාත්‍යාංශය තුළ උපරිම සේවා කාලයක නොසිටි නිලධාරීන් බැවින් ස්ථාන මාරු කර යැවීමේ අවශ්‍යතාව නොතිබිණි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : මහා භාරකාර දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මේ වන විට අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
2	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේදී කඩිනමින් පිළිතුරු සකස්කර ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
3	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	ඉදිරියේදී කඩිනමින් පිළිතුරු සකස්කර ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
4	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂයේ විගණන සැලැස්ම නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
5	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
6	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

7	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට ඉදිරිපත් කර ඇත.
8	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	නාම පුවරුවේ රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර ඇත.
9	වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	දෙමළ පරිවර්තනය සිදුකිරීම සඳහා නිලධාරියෙක් නොමැති බැවින් ප්‍රමාද වීම සිදුවේ.
10	ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවියේ පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව ලබාදීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.
11	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වනවිට පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ඇත.
12	ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මේ වනවිට ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.
13	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023/2024 වර්ෂ සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
14	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2023/2024 වෙනුවෙන් සකස් කර ඇති මානව සම්පත් සැලැස්ම තුළ අවම පැය 12 ක් ඇතුලත් වන පරිදි පුහුණු අවස්ථා ඇතුළත් කර ඇත.

15	සමස්ථ කාර්යමණ්ඩලයට ඇතුළත්ව කර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් මගින් ගිවිසුම්ගත වීමට කටයුතු කර ඇත.
16	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයකු නම් කර නොතිබුණි.	මේ වන විට නිලධාරියෙක් පත් කර ඇත.
17	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමත පැවතුණි.	2023/2024 වර්ෂ වෙනුවෙන් සකස් කර ඇති මානව සම්පත් සැලැස්ම තුළ අවම පැය 12 ක් ඇතුළත් වන පරිදි පුහුණු අවස්ථා ඇතුළත් කර ඇත.
18	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිත කර මට්ටමේ විය.	විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති පහත කරුණු අනුව විගණකාධිපති මතය තත්ත්වාගණනය කර තිබුණි. 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී අයිතිය පවරා ගෙන තිබූ වාහන දෙකට අදාලව වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. - එම වාහන දෙකට අදාලව වටිනාකම තක්සේරු කර 2024 මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන ඇප ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. - ඇප සංගමයෙන් ඇප ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර ඒ අනුව ඇප ලේඛණය සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.
19	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

20	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	සෑම වාර්ෂික ස්ථාන මාරුවීම් තොරතුරු ඉදිරිපත් කිරීමේදී වසර 5 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නාම ලේඛනයක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පාළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ ද එම නිලධාරීන්ට මේ වනතෙක් ස්ථාන මාරුවීම් ලබාදී නොමැත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අදාළ නොවේ.
2	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	සියළු අංශ ප්‍රධානීන් හා ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරුන් සම්බන්ධ කර ගනිමින් රැස්වීම් පවත්වා, අදාළ විගණන විමසුම් පිළිබඳ සාකච්ඡා කොට මසක් ඇතුළත පිළිතුරු යැවීමේ ක්‍රමවේදයක් මේ වනවිට අරඹා ඇත.
3	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මෙම අඩුපාඩු මහහරවා ගනිමින් පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත.
4	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වසරේ භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
5	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අතිරික්තතාවයන් පොත්වලට ඇතුළත් කිරීමත්, ඌනතා පිළිබඳව මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කිරීමත් අරඹා ඇත.

6	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	මෙම දෙපාර්තමේන්තුවට අයත් රථ වාහන 95 (යතුරුපැදි 48ක් ද ඇතුළුව) අතුරින් මේ වනවිට ලියාපදිංචි අයිතිය පවරාගෙන නොමැති, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් PC – 4149 හා 54 – 0372 යන ද්විත්ව කාර්ය වාහන මෙම දෙපාර්තමේන්තුව වෙත නිල වශයෙන් පවරාදීමට එම අමාත්‍යාංශයේ ලේකම් එකඟතාවය පළ කර ඇති අතර ඒ අනුව පැවරුම් ලේඛන සම්පූර්ණ කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. සෙසු සියළු රථ වාහනවල ලියාපදිංචි අයිතිය මෙම දෙපාර්තමේන්තුව සතුව පවතී.
7	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු රථ වාහන 44 ක (යතුරුපැදි හැර) බඳෙහි දෙපාර්තමේන්තු ලාංඡනය සහ නිල නාමය සහිත ස්ටිකර්පත් මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කටයුතු අරඹා. අදාළ ස්ටිකර්පත් වාහනවල බඳෙහි ඇළවීමට කටයුතු සැලසුම් කර ඇත.
8	වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු සියළු ධාවන මට්ටමට නුසුදුසු හා අපහරණය කළ යුතු වාහන හඳුනාගැනීම සඳහා පත් කළ විශේෂ සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ අනුව රථ වාහන 04 ක් (56 – 7649, ISUZU ඩබල් කැබ් රථය, 14-9237MITSUBISHI කාර් රථය, 129 – 6851 SUZUKI AX 100R යතුරුපැදිය සහ UB – 6864 HERO HONDA GLAMOUR යතුරුපැදිය) අපහරණය සඳහා කටයුතු කරමින් පවතී. 2024 වර්ෂය සඳහා ද දෙපාර්තමේන්තුවේ අපහරණය කළ යුතු රථ වාහන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ මණ්ඩලය පිහිටුවීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

9	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මෙතෙක් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොමැති රථ වාහන අනතුරු වලට අදාළව කඩිනමින් මු.රෙ. 104 අනුව වාර්තා කැඳවා අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.
10	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කිරීමක් සිදුකර නැත.
11	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2023.12.31 දින වන විට රු. 97, 095.00ක මුදලක නිරවුල් කර ගන්නා ලදි. පදිංචි ස්ථානවල ලිපිනයන් සොයාගත් ණයකරුවන් හා ඇපකරුවන් වෙත ලිපි යවා ඇත. තවදුරටත් ණයකරුවන් සහ ඇපකරුවන් පිළිබඳ තොරතුරු (ලිපිනයන්) සොයාගැනීමේ කටයුතු කරගෙන යනු ලැබේ. ඒ අනුව ණය අය කර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබේ.
12	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වනවිට නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත.
13	මු.රෙ. 371 හි වන සීමාවන් ඉක්මවා තත්කාරය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමක් සිදුකර නැත.
14	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	වෙන්වන ප්‍රතිපාදන සීමාව තුළ උපරිම වශයෙන් කළමනාකරණය කර ගනිමින් කටයුතු කළ ද දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කිරීම ප්‍රායෝගිකව අසීරු වුවද එම ඉලක්කයට ළඟාවීම අරමුණු කර ගනිමින් 2024 වර්ෂයේ දී ප්‍රශස්ත අයුරින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. තවදුරටත් පවතින දුර්වලතා මහඟරවා ගනිමින් 2025 වර්ෂයේ පුහුණු සැලැස්ම සැකසීමේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට නියමිතව ඇත.
15	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන්

	වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෝෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි.	ක්‍රියාත්මක කිරීමට ද මෙම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන), වගකිව යුතු නිලධාරියා වශයෙන් නම් කර ඇත.
16	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂය තුළ පැවති අධි උද්ධමනකාරී වාතාවරණය තුළ භාණ්ඩ හා සේවාවල ඇස්තමේන්තු වටිනාකමට වඩා කාර්යය කිරීමේදී තත්‍ය වියදම් දැරීමට සිදු විය.එබැවින් පැවති ප්‍රතිපාදන සීමාවන් තුළ සැලසුම්ගත පුහුණු අවස්ථාවන් අතුරින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට අඩු මට්ටමේ පැවතිය ද, 2024 වර්ෂය වනවිට එම සීමාව 50% ඉක්මවීමට හැකියාව පවතින බවට පුරෝකතනය කළ හැකිය. තවද 2025 වසර වනවිට සැලසුම් කරනු ලබන සියලුම පුහුණු අවස්ථා ප්‍රමාණය 100% දක්වා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
17	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාචන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්ත්වාගණනය කළ මතයකි.
18	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු සියලුම නිලධාරීන් සඳහා 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත අනුව 2024.03.31 දිනට අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශය 2024.07.31 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස පුවි/1/3/1/89 දිනැති ලිපිය මඟින් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කර ඇත.
19	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අයකිරීම් කර නොතිබුණි.	අදාළ නොවේ.
20	මු.රෙ. 119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර ගෙන නොතිබුණි.	අදාළ නොවේ.

21	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	2022 වසරේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය නියමිත පරිදි ක්‍රියාත්මක වෙමින් පවතී. වාර්ෂික ස්ථාන මාරු පටිපාටියට අනුකූලව එම කටයුතු සිදුවන අතර 2024 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය මේ වනවිටත් ආරම්භ කර, ක්‍රියාත්මක වෙමින් පවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
1	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
2	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛණය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
3	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	රජයේ වැටුප් සකස් කිරීමේ පරිගනක මෘදුකාංකයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීමට සටහන් කර ගන්නා ලදි.
4	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේ දී නියමිත දිනට විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.
5	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	ඉදිරියේ දී නියමිත දිනට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.
6	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත.
7	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිලධාරි හිඟය හේතු කොට ගෙන නව පත්වීම් ලබා පැමිණි සංවර්ධන නිලධාරි කෙනෙකුට විෂය භාර දී ඇති අතර නියමිත කාල වකවානුව තුල ලබා දී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට

		නොහැකි වී ඇතත් මේ වන විට එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
8	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	වෙන් කළ වාහනය හැර අනෙකුත් සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
9	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	1.වසරකට වඩා වැඩි ණය ශේෂයන්ගෙන් වසර විස්සකටඅඩු ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත. 2.වසර විස්සකට වැඩි එක් නිලධාරිණියකගේ ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටි. 3.වසර තිහකට වැඩි නිලධාරින් තිදෙනෙකුගේ ණය ශේෂ කපා හැරීමට කටයුතු කරමින් සිටි.
10	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යනු ලැබේ.
11	ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත
12	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයකු නම් කර නොතිබුණි.	ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර ඇත.
13	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමත පැවතුණි.	රජයේ වියදම් පාලන චක්‍රලේඛ වලට අනුගත වෙමින් කටයුතු කර ඇති බැවින් පුහුණු අවස්ථා සීමා කර ඇත. මේ වන විට සියලුම නිලධාරින්ට පුහුණු අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත.
14	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිත කර මට්ටමේ විය.	දීර්ඝ කාලීනව ස්ථීර ගණකාධිකාරිවරයෙකු නොමැතිව හා නිලධාරි පුරප්පාඩු නිසා එසේ වූවද මේ වන විට ස්ථීර පදනමින් ගණකාධිකාරිවරයකු පත් කර ඇති බැවින් ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කර ඇත.
15	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

16	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරින් සෑම වසරකම වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලැබුවත් ස්ථාන මාරු නොලැබේ. තවද වසර පහට වැඩි සේවා කාලයක් සහිත සියලුම නිලධාරින්ගේ නාම ලේඛණය ස්ථාන මාරු සඳහා නිර්දේශ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවනු ලැබේ. මේ බව අමාත්‍යාංශයට දැනුවත් කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියක් සකස් කරන ලෙස ලද උපදෙස් මත අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියක් සකස් කරමින් පවති.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ලැබෙන විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කිරීම පිණිස, විගණන විමසුම ලද වහාම ඒ ඒ අංශභාර මාණ්ඩලික නිලධාරින් වෙත යොමු කර, එක් එක් අංශවලට අදාල පිළිතුරු ප්‍රධාන ගණකාධිකාරී වෙත කැඳවා ඉන් අනතුරුව අවසන් පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. එහිදී අදාල අංශවලින් නියමිත වේලාවට පිළිතුරු ලබා දීමට අපොහොසත් වීම හේතුවෙන් මසක් තුල විගණන විමසුම් කිහිපයක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. මේ වන විට ලබා දී ඇති සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇති අතර ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි.

2	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු, ඒ ඒ අංශභාර මාණ්ඩලික නිලධාරීන් විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කරනු ලැබේ. අදාල විගණන විමසුම් 44 න් 10 ක් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශිය කාර්යාලවලට අයත් වන අතර ඒවාට පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඉතිරි විමසුම් 34 විහාර හා දේවාලවලට අදාල වන අතර, ඉන් 9 ක් සඳහා පිලිතුරු ලැබී ඇත. ඒ අනුව ඉතිරි විමසුම් 27ක් සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නැත (පිළිතුරු අපේක්ෂාවෙන් විගනන විමසුම් 36ක් ලබා දී ඇත.) මේ සම්බන්ධයෙන් පිළිතුරු ලැබී නැති සිද්ධස්ථාන සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇත. ඉදිරියේදී විහාර හා දේවාල වලට අදාල විගණන විමසුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රාදේශිය කාර්යාල මට්ටමින් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර එමගින් පසු විපරම් කිරීම හා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
3	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	මු.රෙ.134 (2) අනුව 2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම, වර්ෂය ආරම්භයේ පිළියෙල කර අනුමත කරවා ගෙන ඇත. එම අනුමත විගණන සැලැස්මේ පිටපත් 2022.01.25 දින අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත යොමු කර ඇත.
4	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාල චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල සියලු නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
5	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මේ වන විට මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනු ලැබේ.

6	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	නියමිත කාලයට පෙර ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කිරීමට කටයුතු කරන ලෙස අදාල අංශභාර නිලධාරීන් දැනුවත් කර ඇත.
7	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අදාල ණය ශේෂ පියවා ගැනීමට පියවර ගෙන ඇත.
8	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ පිළිබඳව අවස්ථා කිහිපයකදීම අදාල නිලධාරීන් දැනුවත් කරන ලද අතර , මේ සම්බන්ධයෙන් 2023.12.10 දිනැතිව 2023/මුදල්/1 ලෙස දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛයක්ද නිකුත් කර ඇත.
9	වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	මේ වන විට වාර්ෂික කාර්යසාධන වාර්තා නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
10	2018 ජනවාරී 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වනවිට මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.
11	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයේ විෂය බෙදීම හා එම විෂයන් අනුව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.
12	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස අදාල සියලු නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ වන විට බොහෝ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
13	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ වර්ෂ පහකට වැඩි නිලධාරීන් ස්ථාන මාරු නොකිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් කිහිප වතාවක්ම විමසිම් කරන ලද අතර අවුරුදු පහකට වැඩි සියලු නිලධාරීන්ගේ තොරතුරුද ඒ සමඟ යොමුකර ඇත. වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලියට සමගාමීව මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන් ස්ථානමාරු කිරීම 2024.05.02 අවසන් කරන ලදි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
1	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අදාල නැත
2	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	නිලධාරීන් විශ්‍රාම යාම, වැටුප් රහිත නිවාඩු ලබාගැනීම ආදී විවිධ කරුණු මත හා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විවිධ උත්සව රාශියක් පැවතීම හේතුවෙන් විගණණ විමසුම්වලට අදාල තොරතුරු සපයා ගැනීමට වැඩි කාලයක් ගතවීම මෙයට හේතුවී ඇත. මේ වන විට එම තත්වයන් මගහරවා ගැනීමට පියවර ගෙන ඇත.
3	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය අරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාශය මගින් සිදු කෙරේ.
4	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	අවශ්‍ය ගැලපීම් සිදුකර මු.රෙ. ප්‍රකාරව කටයුතු කර ඇත.
5	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	රට පුරා විහිදී ඇති කලායතන 1288 ක් සඳහාවූ ආධාර ලබාදීමට වෙන්වූ ප්‍රතිපාද ප්‍රමාණවත් නොවීම මත වෙනත් එම කරුණ හා අදාල කරගත හැකි වැය විෂයක ප්‍රතිපාදන මේ සඳහා භාවිතා කර ඇත.
6	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙම හිඟ ණය ශේෂ අයකිරීම පිළිබඳ කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
7	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මේ වනවිට කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධව මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත.

8	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	අදහස් / යෝජනා / පැමිණිලි ලේඛනයක් සහ තොරතුරු පනත අනුව ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා දීම සඳහා ලේඛන නඩත්තු කර ඇත
9	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිත කර මට්ටමේ විය.	මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව විගණන මතය වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	මේ වන විට සියලුම වාහන වල අයිතිය තහවුරු කිරීමේ ලිපි ලේඛන දෙපාර්තමේන්තුව සතුව ඇත.
2	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	දෙපාර්තමේන්තුවේ සේවය කර ස්ථාන මාරු වීම් ලැබූ එස්. සින්නකම්බි, ආරියපාල සහ සිවලිංගම් යන නිළධාරීන්ගේ හිඟ ණය ශේෂ පිළිවෙලින් රුපියල් 15,846.66, රුපියල් 16,163. සහ රුපියල් 14,452.75කි. එම නිළධාරීන් පිළිබඳ විස්තර නොමැති නිසා වසර 31කට වැඩිකාලයක් මෙම මුදල අයකර ගැනීමට නොහැකි විය. 2024/05/29 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛනය අනුව අංක 01/2024 හි 113 දක්වා ඇති විධිවිධාන අනුව හිඟ ශේෂය කපා හරිමට අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

3	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා දින තුනක පුර්ණකාලීන පුහුණුවක් 2023 දෙසැම්බර් මාසයේ ලබා දී ඇත. කාර්ය මණ්ඩල තනි පුද්ගල පුහුණු වැඩසටහන් සඳහා ද සහභාගී වී ඇත.
4	සැලසම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
5	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	ක්‍රියාමාර්ග ගෙන ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දැනට රාජකාරී සිදු කරන සියළුම අංශ වලට අදාළව 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2024.05.21 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
2	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයට අදාළ භාණ්ඩ වෙන්දේසි කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇත.
3	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.
4	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේදී සැලසුම් කල පරිදි නිලධාරීන් වෙත පුහුණු අවස්ථා සලසා දෙන ලදි.
5	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	පහත දක්වා ඇති කරුණු මත විගණන මතය තත්ත්වාගණනය කර තිබූ අතර එහි වර්තමාන ප්‍රගතිය පහත පරිදි වේ. (අ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සිදු වූ වරද 2022 වර්ෂයේ නිවැරදි කර ඉදිරිපත් කර ඇත. තවදුරටත් නිවැරදි කිරීම සිදු කළ යුතු

		නොවේ. (ආ) රු.11,772/-ක් තවදුරටත් සොයාගත නොහැකි ශේෂයක් ලෙස එම ගිණුමේ විද්‍යාමාන වේ. එකී මුදල හැරුණු විට අනෙකුත් ශේෂයන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ශේෂයන්ගේ ආරම්භක ශේෂයන් අතර ගැලපීම් සිදු කර තුලනය කර ඇත. තවදුරටත් සොයාගත නොහැකි කේවල ශේෂය වූ රු.11,772/-ක මුදල ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. (ඇ) ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීමේ වියදම (209-02-02-2001) වන අතර එහි කෙරීගෙන යන වැඩ සටහන මඟින් සිදු කරනු ලබයි. එහෙත් මේ මඟින් අදාළ ගොඩනැගිල්ලේ ඵලදායී ජීව කාලය ඉහළ නැංවීම සිදු වන බැවින් ප්‍රතිසංස්කරණ කටයුතු ඉදිරියේදී සිදු කරනු ලැබේ. එමෙන්ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලේ (B ගොඩනැගිල්ල) වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මඟින් ඉල්ලුම් කර ඇති අතර අදාළ කටයුතු අවසන් වූ පසු වටිනාකම ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර දැක්වීමට කටයුතු කරමි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**
1	2020.08.08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2023.05.25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
2	මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	එම මුදලින් රු.1,870,179.00ක් සඳහා අදාළ වැය විෂය 208-02-03-2001 විය යුතු වන අතර, එහි වර්ෂය අවසානයේ රු.7,353,379.99ක් ඉතිරිව තිබුණි. ඉතිරි රු.1,591,533.00 මු.රෙ. 94(2) පරිදි ඇති කර ගෙන ඇති බැඳීම් වේ. එම වර්ෂයට අදාළ බිල්පත් ඊට පසු වර්ෂයේදී ගෙවීම්

		සිදු කර ඇත.
3	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2022.12.31 දිනට පැවති හිඟ ණය ශේෂයෙන් කේ. අභයවර්ධන හා කේ.ජී.එන්.ටී. ලක්මාල් යන අය වාරික වශයෙන් මුදල් ගෙවන අතර, එම මුදලින් රු.87,690.78 මේ වන විට අය කරගෙන ඇත. තවද, රු. 316,840ක් ඩබ්.එන්. විමලවීර මයාගේ ණය ශේෂය පාරිතෝෂිකයෙන් අදාළ චෙක්පත ලැබීමට නියමිතය. එන්.එම්. සමරසිංහ මයාගේ රු.1,437ක මුදල කපා හැරීමට අනුමැතිය ලැබී ඇත. ඉතිරි මුදල රු. 328, 921.86 ක් අය කර ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර ගෙන ඇත.
4	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීම ඉඩම් ගොඩනැඟිලි තක්සේරු කර ගිණුම්ගත නොකිරීම මත ලබාදී ඇත. මෙම කෞතුකාගාර පවත්වාගෙන යන පෞරාණික ගොඩනැඟිලි හා ඒවා පිහිටුවා ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට අයත් ඉඩම්වල වන අතර, එම ඉඩම් හා ගොඩනැඟිලි 10න් 04ක් තක්සේරු කර ගිණුම්ගත කර ඇත. ගොඩනැගිලි 02ක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කෞතුකාගාර දෙපාර්තමේන්තුවට පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු සිදු කරන බව දන්වා ඇත. එක් ගොඩනැඟිල්ලක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ද, තවත් ගොඩනැඟිල්ලක් දළඳා මාළිගාවට ද, අයත් වේ. කොළඹ කෞතුකාගාර ගොඩනැඟිල්ල හා ඉඩම තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට අදාළ ලේඛන යොමු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වර්තමාන තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
1	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන මේ වන විට එම නිලධාරීන්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර ඇති අතර ඇප ලේඛනය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. විගණකාධිපති වාර්තාවේ ඇතුළත් අනෙකුත් නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත. (දෙපාර්තමේන්තු පාලනයෙන් අවරණය වන)

A.M.P.M.B. Atapattu
Secretary
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
No. 135, Srimath Anagarika Dharmapala Mawatha,
Colombo 07.

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු,

ලේකම්,

බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි (පා.ම.)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
08 වන මහල, සෙත්සිරිපාය
බත්තරමුල්ල.

ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය